# මධ්‍යම පලාත් සභාවේ
# පලාත් පාලන ආයතනවල ගිනි නිවීමේ සේවයේ
# සේවා ව්‍යවස්ථා සංග්‍රහය

01. මෙම සේවා ව්‍යවස්ථා සංග්‍රහය "මධ්‍යම පලාතේ පලාත් පාලන ආයතනවල ගිනි නිවීමේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය" යනුවෙන් හඳුන්වනු ලබන අතර, මධ්‍යම පලාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් මේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුමත කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක වේ.

02. **අර්ථ නිරූපන**

මේ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් -

**"ආණ්ඩුකාරතුමා"**. යන්නෙන්. මධ්‍යම පලාතේ ආණ්ඩුකාරවරයා ද.

**"කොමසාරිස්"** යන්නෙන්. මධ්‍යම පලාතේ පලාත් පාලන කොමසාරිස්වරයා ද.

**"පලාත් පාලන ආයතනය"**. යන්නෙන්. මධ්‍යම පලාත තුල සංස්ථාපනය කරනු ලැබ ඇති කිසියම් මහා නගර සභාවක්. නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් ද.

**"පරිපාලන ප්‍රධානියා"** යන්නෙන්. මහා නගර සභාවක් සම්බන්ධයෙන් වන විට එහි නාගරික කොමසාරිස්වරයාද , යම් නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් වනවිට එහි ලේකම්වරයා ද.

**"පත්වීම් බලධාරියා"** යන්නෙන්.මධ්‍යම පලාතේ පලාත් පාලන කොමසාරිස්වරයා ද.

**"කොමිෂන් සභාව"**. යන්නෙන්. මධ්‍යම පලාතේ පලාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ද.

**"ක්‍රියාත්මක වන දිනය"** යන්නෙන්. මෙම බඳවා ගැනීමේ සේවා ව්‍යවස්ථාව ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කල දිනය ද.

**" සක්‍රිය සේවා කාලය."** යන්නෙන්. කිසියම් වැටුප් හෝ වැටුප් රහිත හෝ සේවා කාලයක් සහ සේවය බණ්ඩනය වීම හේතුවෙන් සේවයට නොපැමිණ සිටි කාලයන් අත්හැරීමෙන් පසුව ඉතිරි වන. සත්‍ය වශයෙන් ම තනතුරට අදාල රාජකාරියේ නියුක්තව සිටි සේවා කාලය අදහස් වන අතර. මධ්‍යම පලාත් සභාවේ උවමනාවන්ට හා / හෝ ප්‍රතිපත්තිමය තීරණවලට යටත් ව ස්වකීය තනතුරට අදාලව වැටුප් වර්ධක උපයාගෙන තිබෙන හා ඒ අනුව තමාට පැවරුණු රාජකාරියෙහි සත්‍ය වශයෙන් ම නිරතව සිටිමින් වැටුප් ලබාගෙන ඇති කාල සීමාවක් ද. එයට ඇතලත් විය යුතු ය.

**"සතුටුදායක සේවා කාලය"** යන්නෙන්. අදාල කාලය තුල අවම වශයෙන් සාමාන්‍ය මට්ටමේ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබෙන්නාවූ ද. අත්හිටුවීමකට හෝ නතර කිරීමකට හෝ අඩු කිරීමකට හෝ විලම්භනය කිරීමකට හෝ යටත් නොකර නියමිත පරිදි වැටුප් වර්ධක උපයා ගෙන තිබීම සහ අවවාද කිරීමක් හැර වෙනත් යම් ආකාරයක විනයානුකූල දඬුවමකට යටත් නොවී සිටියා වූ ද කාලයක් ද.

අදහස් වේ.

03. **මෙම තනතුරු.**

"මධ්‍යම පලාත් සහා රාජ්‍ය සේවයේ ගිනි නිවීමේ සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ ගිනි නිවීම් සේවා තනතුරු" යනුවෙන් හැඳින් වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2011/01/31 දින අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

**04.** **සේවක සංඛ්‍යාව .**

එක් එක් තනතුරුවල පැවතිය යුතු සේවක සංඛ්‍යාව සේවා අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන වරින්වර මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම් විසින් තීරණය කරනු ලැබේ .

**05.** **සේවා කොන්දේසි හා නියමයන් :-**

I මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

II ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද. මධ්‍යම පළාත් සභාවේ මුදල් රෙගුලාසි වලට නොහොත් නියෝග වලටද. මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කළ පනවනු ලබන වෙනත් කොන්දේසිවලටද. අනුකූලව ක්‍රියා කළ යුතුය. මෙම තනතුරේ සේවය මධ්‍යම පළාත තුළට සීමා වේ.

III පළාත් පාලන ආයතන විසින් පනවනු ලබන අතුරු ව්‍යවස්ථා විධිවිධාන ක්‍රියාත්මක කිරීමට යටත් වේ.

**06.** **අන්තර්ග්‍රහණ විධිවිධාන.**

ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට දරණ තනතුරුවල වෙනසක් නොමැතිව නව ව්‍යවස්ථාව යටතට අන්තර්ග්‍රහනය කර ගන්නා අතර පෙර ව්‍යවස්ථාව යටතේ තමන්ට හිමිව තිබූ ජ්‍යෙෂ්ඨතාවය නොවෙනස්ව පවතී. ඔවුන්ගේ වැටුප් පරිවර්තනයේද ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4 වන වගන්තිය අනුව කටයුතු කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2011/01/31 දින
අනුමත කර ... දී.
ආණ්ඩු... ලේකම්

# <u>තනතුර - ගිනිහට නිලධාරි තනතුර</u>

**01** වැටුප් පරිමාණය :-

මාසික රු. 14.280/= -7×145-10×180-17×240 -21.175/-
ආර්.එස්.-1-2006-( රා.ප.ච. 6/2006 A)
වැටුප් පියවර - ආරම්භක පියවර

මෙම වැටුප් පරිමාණයේ හතරවන වැටුප් තලයට ළඟාවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

**02.** වයස් සීමාව :-

අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර. 25 ට නොවැඩි විය යුතුය.
(දැනටමත් මධ්‍යම පලාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර නිලධාරින් සඳහා ඉහත උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

**03.** අධ්‍යාපන සුදුසුකම් :-

(අ) අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් අඩු වශයෙන් වාර දෙකකදී සිංහල/දෙමළ. ගණිතය. විද්‍යාව ඇතුලු විෂයයන් 06 කින් සමත් වී තිබිය යුතු අතර. ඉන් විෂයයන් 05 ක් එක් අවස්ථාවකදී සමත් වී තිබිය යුතුය.

**04.** වෙනත් සුදුසුකම් :-

01. (ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරිර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු අතර. ඔවුන්.

I අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
II මධ්‍යම පලාත තුල අවම වශයෙන් පූර්වාසන්න වසර 3 ක ස්ථිර පදිංචියක් තිබිය යුතුය.
III අඩි 5 අගල් 4 ක අවම උසකින් යුක්ත විය යුතුය.
IV කි.ග්‍රෑම් 56 ක අවම බරකින් යුක්ත විය යුතුය.
V පපුව අගල් 32 ට (ප්‍රසාරණය කල විට) නොඅඩු විය යුතුය .
VI අයදුම්කරුවන් අවිවාහක විය යුතුය.
VII බර වාහන පැදවීමේ රියදුරු බලපත්‍රය ලබා තිබිය යුතුය.

(ආ) ගිනි නිවීමේ පුහුණුව පිළිබඳව පාඨමාලාවක් හදාරා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ .

02. කායික හා මානසික යෝග්‍යතාවය

සේවය කිරීම සඳහා සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයක් පවතින බවට රජයේ පිළිගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කල යුතුය .

**05.** බඳවා ගැනීමේ ක්‍රමය :-

01. (අ) අදාල පලාත් පාලන ආයතනය විසින් ප්‍රසිද්ධ දැන්වීම් මගින් අයදුම්පත් කැඳවා රා.ප.ච. 15/90 පරිදි ලිඛිත පරීක්ෂණයක් හා යෝග්‍යතා පරීක්ෂණයක් පවත්වා එහි ප්‍රතිඵල මත තෝරා ගන්නා අය සම්මුඛ

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2011/01/31 .........දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම සිදු කෙරේ.

<u>බඳවා ගැනීමේ</u>

<u>ලිඛිත පරීක්ෂණය</u> :-

(අ) සාමාන්‍ය දැනීම හා බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා වන පැය 01 ක ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතුය.

<u>ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය</u> :-

(ආ) ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා අවස්ථාවෝචිත පරිදි යෝග්‍යතා පරීක්ෂණයක් සිදු කෙරේ.

ශාරීරික යෝග්‍යතාව මැන බැලීමේ පරීක්ෂණයේ දී අයදුම්කරුට පාලනය කරගතහැකි හේතු මත සිදුවන යම් තුවාලවීම් හෝ ආපදාවන් සම්බන්ධයෙන් වගකීමට බැඳී නොසිටින අතර ඒ බවට ලිඛිත පොරොන්දුවක් මෙකී පරීක්ෂණයට පෙර ලබා දිය යුතුය.

02. සම්මුඛ පරීක්ෂණ/ප්‍රායෝගික පරීක්ෂණ

පළාත් පාලන කොමසාරිස් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පැවැත්විය යුතු අතර පරීක්ෂණ මණ්ඩලය හා ලකුණු ලබා දීමේ නිර්ණායකයන් පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය .

06. අනෙකුත් සේවා කොන්දේසි :-

තෝරාගනු ලබන අයදුම්කරුවන් එක් අවුරුදු පුහුණු පාඨමාලාවක් හැදැරිය යුතුය. පුහුණු කාල සීමාව තුළදී වැඩ හා හැසිරීම සතුටුදායක නොවන හෝ අපේක්ෂිත රැකියා මට්ටමට ළගා විය නොහැකි වන පුහුණු කරුවන් කිසිම වන්දියකින් තොරව පුහුණුවෙන් ඉවත් කිරීම පත්වීම් බලධාරියාට කළ හැකිය.

පුහුණු කාල සීමාව තුළදී රු. 5000/- ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

පුහුණුව සාර්ථකව නිම කරනු ලබන අභ්‍යාසලාභීන් මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ ගිනිහට තනතුරට අදාල වැටුප් තලය මත පත් කරනු ලැබේ.

පුහුණුව සඳහා ඇතුලත් වන අවස්ථාවේදී අභ්‍යාසලාභීන් විසින් පුහුණුව සාර්ථකව නිම කිරීමෙන් අනතුරුව වර්ෂ 05 ක කාල සීමාවක්. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන බවට රු. 10000/- ක වටිනාකමකින් යුතු බැදුම්කරයක් අත්සන් කළ යුතුය.

පුහුණුව ආරම්භ කිරීමට පෙර සියළුම අභ්‍යාසලාභීන් වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

ගිනි භටයන් වශයෙන් පත්වීම් ලැබූ විට එම පත්වීම්ලාභීන් අදාල පළාත් පාලන බල ප්‍රදේශය තුළ පදිංචි වීම අනිවාර්ය වේ.

පුහුණු කාල සීමාව තුල දී පුහුණුකරුගේ යම් දුර්වලතාවන් නොසැලකිල්ලක් හෝ අනවධානය හෝ වෙනත් යම් හේතුවක් මත හෝ සිදුවන ශාරීරික ආබාධ සම්බන්ධයෙන් අදාල පළාත්පාලන ආයතනය වගකීමට බැඳී නොසිටී.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2011/01/31 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම

07. අන්තර් කාලීන විධි විධාන

මෙම ව්‍යවස්ථාව අනුමත කරන දිනට පළාත් පාලන ආයතන වල දැඩි සේවා අවශ්‍යතාවය මත ආධුනික/පුහුණුලාභී පදනම මත බඳවා ගෙන ඇති නිලධාරීන්ට මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන පළමු අවස්ථාවේ දී පමණක් උපරිම වයස් සීමාව සහ විවාහක බව නොසලකා හරිනු ලබන අතර. සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.

08. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007 විධි විධාන අනුව 2007.07.01 දින සිට පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් සේවයට බැඳී වසර 5 ක් තුළ ලබා ගත යුතු ය. මේ සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

පත්වීමේ දින සිට වසර පහක් තුළ නියමිත දෙමළ භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

ලබාගත යුතු ප්‍රවීණතා මට්ටම III

09. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය :-

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් බලය පවරනු ලැබූ නිලධාරියකු මඟින් පවත්වනු ලිඛිත පරීක්ෂණය සමත් වීමෙන් අනතුරුව ප්‍රායෝගික පරීක්ෂණයකින් කාර්යක්ෂමතා කඩඉමෙන් ඔබ්බට උසස් කරනු ලැබේ.

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂය නිර්දේශය :-

ලිඛිත පරීක්ෂණය

පැය තුනක ප්‍රශ්ණ පත්‍රයකට පෙනී සිටිය යුතුය. සමත්වීම සඳහා අවම වශයෙන් 40 % ලකුණු ලබාගත යුතුය

විෂය නිර්දේශය උපලේඛණ 01හි දැක්වේ.

ප්‍රායෝගික පරීක්ෂණය

පහත කරුණු පිළිබඳව දැනුම අපේක්ෂා කෙරේ .

1. ශ්වසන උපකරණ ක්‍රියාකාරීත්වය
2. පොම්ප සරඹ
3. ගැට වර්ග
4. ඉනිමං භාවිතය
5. ගිනි රථවල උපකරණ හඳුනාගැනීම

සමත්වීම සඳහා අවම වශයෙන් 40 % ලකුණු ලබාගත යුතුය

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2011/01/31 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

<u>තනතුර - මෝටර් යාන්ත්‍රික ගිනිභට නිලධාරි තනතුර</u>

01 වැටුප් පරිමාණය :- මාසික රු. 14,280/= - 7×145-10×180-17×240-21,175/-
ආර්.එස්.-1-2006-( රා.ප.ච. 6/2006 A)
වැටුප් පියවර - 5 වන පියවර

මෙම වැටුප් පරිමාණයේ හතරවන වැටුප් තලයට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

02. වයස් සීමාව :- වයස අවුරුදු 22 ත් 45 ත් අතර විය යුතුය. (දැනටමත් මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතනයක ගිනි නිවන ස්ථිර නිලධාරින් සඳහා ඉහත උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

03. සුදුසුකම් :-

01. I මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තනතුරේ ස්ථිර කරන ලද ගිනි භටයෙකු ලෙස අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය.

II බරවාහන පැදවීමේ රියදුරු බලපත්‍රයක් ලබා තිබිය යුතුය.

III බරවාහන පැදවීම පිළිබඳව අවම වශයෙන් අවු. 02 ක පළපුරුද්දක් තිබිය යුතුය.

හා

IV අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙරාතුව මධ්‍යම පළාත තුළ යටත් පිරිසෙයින් වසර 3 ක වත් ස්ථිර පදිංචියක් ඇති තැනැත්තකු විය යුතුය.

02. කායික හා මානසික යෝග්‍යතාවය

සේවය කිරීම සඳහා සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයක් පවතින බවට රජයේ පිළිගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුය .

04. බඳවා ගැනීමේ ක්‍රමය :-

01. (අ) පළමුව අදාල පළාත් පාලන ආයතනයේ සේවයේ නියුතු ඉහත 03 ඡේදයේ සුදුසුකම් සපුරාලන ගිනි භටයින් අතුරින් අයදුම්පත් කැඳවා ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා උසස් කිරීමෙන් පවත්නා පුරප්පාඩු පුරවනු ලැබේ. පොම්ප ක්‍රියාකාරිත්වය හා බර වාහන පැදවීම පිළිබඳව ප්‍රායෝගික පරීක්ෂණයකටද පෙනී සිටි ලකුණු 40% ලබා සමත් විය යුතුයි.

(ආ) එසේ උසස් කිරීමෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි අවස්ථාවලදී ඉහත 03 ඡේදයේ සුදුසුකම් සපුරාලන අයගෙන් ප්‍රසිද්ධ දැන්වීම මගින් අයදුම්පත් කැඳවා රා.ප.ච. 15/90 ට ප්‍රකාරව ලිඛිත පරීක්ෂණයක් හා ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වා එහි කුසලතාවය මත තෝරා ගන්නා අය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සිදු කෙරේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2011/01/31 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

බඳවා ගැනීමේ

ලිඛිත පරීක්ෂණය :-

පහත විෂයයන්ගෙන් යුක්ත පැය 03 ක ප්‍රශ්න පත්‍රයකට පෙනී සිට ලකුණු 40% ලබා සමත් විය යුතුයි.

I මූලික ගිනි නිවීමේ ක්‍රම

II මෙහෙයුම් ක්‍රම

ප්‍රායෝගික පරීක්ෂණය :-

පොම්ප ක්‍රියාකාරිත්වය හා බර වාහන පැදවීම පිළිබඳව ප්‍රායෝගික පරීක්ෂණයකට පෙනී සිටි ලකුණු 40% ලබා සමත් විය යුතුයි.

02. සම්මුඛ පරීක්ෂණ/ප්‍රායෝගික පරීක්ෂණ

පළාත් පාලන කොමසාරිස් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින් පැවැත්විය යුතු අතර පරීක්ෂණ මණ්ඩලය හා ලකුණු ලබා දීමේ නිර්ණායකයන් පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය .

05. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007 විධි විධාන අනුව 2007.07.01 දින සිට පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් සේවයට බැඳී වසර 5 ක් තුළ ලබා ගත යුතු ය. මේ සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

පත්වීමේ දින සිට වසර පහක් තුළ නියමිත දෙමළ භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක. සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

ලබාගත යුතු ප්‍රවීණතා මට්ටම III

06. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය :-

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මගින් හෝ කොමිෂන් සභාව බලය පවරනු ලැබූ නිලධාරියකු විසින් පවත්වනු ලිඛිත පරීක්ෂණය සමත් වීමෙන් අනතුරුව ප්‍රායෝගික පරීක්ෂණයකින් කාර්යක්ෂමතා කඩඉමෙන් ඔබ්බට උසස් කරනු ලැබේ.

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂය නිර්දේශය :-

පැය තුනක ප්‍රශ්ණ පත්‍රයකට පෙනී සිටිය යුතුය. සමත්වීම සඳහා අවම වශයෙන් 40 % ලකුණු ලබාගත යුතුය

විෂය නිර්දේශය උපලේඛණ 02 හි දැක්වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
......2011/01/31...... දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

## තනතුර - පළමුපෙළ ගිනිහට නිලධාරි තනතුර

01 වැටුප් පරිමාණය :- මාසික රු. 14,280/= -7 ×145-10×180-17×240-21,175/-
ආර්.එස්.-1-2006-( රා.ප.ච. 6/2006 A)
වැටුප් පියවර - 9 වන පියවර

මෙම වැටුප් පරිමාණයේ හතරවන වැටුප් තලයට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

02. වයස් සීමාව :- අවුරුදු 22 ත් 45 ත් අතර විය යුතුය.
(දැනටමත් මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතනයක ගිනි නිවීම් සේවයේ ස්ථිර නිලධාරීන් සඳහා ඉහත උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

03. සුදුසුකම් :-

01. I පළාත් පාලන සේවයේ ස්ථිර කරන ලද මෝටර් යාන්ත්‍රික ගිනි හටයෙකු ලෙස අවම වශයෙන් වසර 03 ක සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය.

හා

II අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙරාතුව මධ්‍යම පළාත තුල යටත් පිරිසෙයින් වසර 3 වත් ස්ථිර පදිංචියක් ඇති තැනැත්තකු විය යුතුය.

02. කායික හා මානසික යෝග්‍යතාවය

සේවය කිරීම සඳහා සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයක් පවතින බවට රජයේ පිළිගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුය .

04. බඳවා ගැනීමේ ක්‍රමය :-

01. (අ) පළමුව අදාල පළාත් පාලන ආයතනයේ සේවයේ නියුතු ඉහත 03 ඡේදයේ සුදුසුකම් සපුරාලන මෝටර් යාන්ත්‍රික ගිනි හටයින් අතරින් අයදුම්පත් කැඳවා ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව මත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා උසස් කිරීමෙන් පවත්නා පුරප්පාඩු පුරවනු ලැබේ.

(ආ) එසේ උසස් කිරීමෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි අවස්ථාවලදී ඉහත 03 ඡේදය යටතේ සුදුසුකම් සපුරාලන අයගෙන් ප්‍රසිද්ධ දැන්වීම් මගින් අයදුම්පත් කැඳවා රා.ප.ච. 15/90 ප්‍රකාරව ලිඛිත පරීක්ෂණයක් පවත්වා එහි කුසලතාව මත තෝරා ගන්නා අය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සිදු කෙරේ.

බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය :-

පහත විෂයයන්ගෙන් යුක්ත පැය 03 ක ප්‍රශ්න පත්‍රයකට පෙනී සිට ලකුණු 40% ලබා සමත් විය යුතුයි.

I විද්‍යාව
II තාක්ෂණය
III අන්තරාදායක ද්‍රව්‍ය

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2011/01/31 දින
අනුමත කරන ලදි.
ආණ්ඩුකාර ලේකම්

02. සම්මුඛ පරීක්ෂණ

පළාත් පාලන කොමසාරිස් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින් පැවැත්විය යුතු අතර පරීක්ෂණ මණ්ඩලය හා ලකුණු ලබා දීමේ නිර්ණායකයන් පිලිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය

05. අනෙකුත් සේවා කොන්දේසි :-
බර වාහන පැදවීමේ රියදුරු බලපත්‍රයක වලංගුතාවය තබා ගත යුතුය

06. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007 විධි විධාන අනුව 2007.07.01 දින සිට පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැදුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිලිබඳ ප්‍රවීණතාවයක් සේවයට බැදී වසර 5 ක් තුල ලබා ගත යුතු ය. මේ සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

පත්වීමේ දින සිට වසර පහක් තුල නියමිත දෙමල භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක. සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

ලබාගත යුතු ප්‍රවීණතා මට්ටම III

07. කාර්යක්ෂමතා කඩඉම් ලිඛිත පරීක්ෂණය:-

පැය තුනක ප්‍රශ්ණ පත්‍රයකට පෙනී සිටිය යුතුය. සමත්වීම සඳහා අවම වශයෙන් 40 % ලකුණු ලබාගත යුතුය

විෂය නිර්දේශය උපලේඛණ 03 හි දැක්වේ.

(මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් පැවැත්වේ.)

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2011/01/31 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

## තනතුර - මූලික ගිනිභට නිලධාරී තනතුර

01 වැටුප් පරිමාණය :-

මාසික රු. 15,850/=-180×7-240×2-320×8-375×17-26,525/=
ආර්.එස්.-2-2006-( රා.ප.ච. 6/2006 A)
වැටුප් පියවර - ආරම්භක පියවර

මෙම වැටුප් පරිමාණයේ හතරවන වැටුප් තලයට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

02. වයස් සීමාව :- අවුරුදු 22 ට නොඅඩු 45 නොවැඩි විය යුතුය. (දැනටමත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර නිලධාරීන් සඳහා ඉහත උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

03. සුදුසුකම් :-

01. I මධ්‍යම පළාතේ පළාත් පාලන සේවයේ ස්ථිර කරන ලද පළමුවන පන්තියේ ගිනිභටයෙකු ලෙස අවම වශයෙන් වසර 03 ක සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය.

හා

II අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙරාතුව මධ්‍යම පළාත තුල යටත් පිරිසයෙන් වසර 3 ක වත් ස්ථිර පදිංචියක් ඇති තැනැත්තෙකු විය යුතුය.

02. කායික හා මානසික යෝග්‍යතාවය

සේවය කිරීම සඳහා සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයක් පවතින බවට රජයේ පිළිගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කල යුතුය .

04. බඳවා ගැනීමේ ක්‍රමය :-

01. (අ) පළමුව අදාල පළාත් පාලන ආයතනයේ සේවයේ නියුතු ඉහත 03 ඡේදයේ සුදුසුකම් සපුරාලන පළමුවන පන්තියේ ගිනි භටයින් අතරින් අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත උසස් කිරීමෙන් පවත්නා පුරප්පාඩු පුරවනු ලැබේ.

(ආ) එසේ උසස් කිරීමෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි අවස්ථාවලදී ;

ඉහත 03 ඡේදයේ සුදුසුකම් සපුරාලන අයගෙන් ප්‍රසිද්ධ දැන්වීම් මගින් අයදුම්පත් කැඳවා රා.ප.ච. 15/90 ප්‍රකාරව ලිඛිත වෘත්තීය පරීක්ෂණයක් පවත්වා එහි කුසලතාව මත තෝරා ගන්නා අය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සිදු කෙරේ.

බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය :-

පහත විෂයයන්ගෙන් යුක්ත පැය 03 ක ප්‍රශ්න පත්‍රයකට පෙනී සිට ලකුණු 40% ලබා සමත් විය යුතුයි.

I විද්‍යාව
II තාක්ෂණය
III අන්තරාදායක ද්‍රව්‍ය

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2011/01/31 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

IV විධානය හා නායකත්වය

02. සම්මුඛ පරීක්ෂණ

පලාත් පාලන කොමසාරිස් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින් පැවැත්විය යුතු අතර පරීක්ෂණ මණ්ඩලය හා ලකුණු ලබා දීමේ නිර්ණායකයන් පිලිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය

05. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007 විධි විධාන අනුව 2007.07.01 දින සිට පලාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරින් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිලිබඳ ප්‍රවීණතාවයක් සේවයට බැඳි වසර 5 ක් තුළ ලබා ගත යුතු ය. මේ සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

පත්වීමේ දින සිට වසර පහක් තුල නියමිත දෙමළ භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරින්ගේ වැටුප් වර්ධක. සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

ලබාගත යුතු ප්‍රවීණතා මට්ටම III

06. කාර්යක්ෂමතා කඩඉම :-

පැය තුනක ප්‍රශ්ණ පත්‍රයකට පෙනී සිටිය යුතුය. සමත්වීම සඳහා අවම වශයෙන් 40 % ලකුණු ලබාගත යුතුය

විෂය නිර්දේශය උපලේඛණ 04 හි දැක්වේ.

(මධ්‍යම පලාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් පැවැත්වේ.)

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2011/01/31 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම

## තනතුර - අංශභාර නිලධාරි තනතුර

01 වැටුප් පරිමාණය :-

මාසික රු. 15,850/= - 180×7-240×2-320×8-375×17-26,525/=
ආර්.එස්.-2-2006-( රා.ප.ච. 6/2006 A)
වැටුප් පියවර - 5 වන පියවර

මෙම වැටුප් පරිමාණයේ හතරවන වැටුප් තලයට එලඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

02. වයස් සීමාව :- අවුරුදු 25 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය.
(දැනටමත් මධ්‍යම පලාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර නිලධාරින් සඳහා ඉහත වයස් සීමාව බල නොපානු ඇත.)

03. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :-

01. (I) මධ්‍යම පලාත් සභා රාජ්‍ය සේවයේ ගිනි නිවීම් කටයුතු පිලිබඳව අවුරුදු 10 ට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය. මින් අවු. 3 කට නොඅඩු කාල සීමාවක් තනතුරේ ස්ථිර කරනු ලැබූ මූලික ගිනි භටයෙකු වශයෙන් සතුටුදායක සේවයක් තිබීම

(II) බාහිර අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර මධ්‍යම පලාත තුල අවම වශයෙන් වසර 03 ක ස්ථිර පදිංචියක් තිබිය යුතුය.

02. කායික හා මානසික යෝග්‍යතාවය

සේවය කිරීම සඳහා සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයක් පවතින බවට රජයේ පිලිගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කල යුතුය .

04. බඳවා ගැනීමේ ක්‍රමය :-

01. (I) පලමුව අදාල පලාත් පාලන ආයතනයේ සේවයේ නියුතු ඉහත සුදුසුකම් සපුරාලන හා අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්නයේ වසර 5 තුල සියළු වැටුප් වර්ධක උපයාගෙන ඇති අය අතුරෙන් අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත උසස් කිරීමෙන් පවත්නා පුරප්පාඩු පුරවනු ලැබේ.

(II) එසේ උසස් කිරීම මගින් පුරප්පාඩු පිරවීමට නොහැකි අවස්ථාවලදී ඉහත 03 ඡේදයේ සුදුසුකම් සපුරාලන අයගෙන් අයදුම්පත් කැඳවා රා.ප.ච. 15/90 ට ප්‍රකාර ලිඛිත පරීක්ෂණයක් පවත්වා එහි කුසලතාවය මත තෝරා ගන්නා අයවළුන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම් සිදු කෙරේ.

<u>බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය</u> :-

පහත විෂයයන්ගෙන් යුක්ත පැය 03 ක ප්‍රශ්න පත්‍රයකට පෙනී සිට ලකුණු 40% ලබා සමත් විය යුතුයි.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2011/01/31 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

I විද්‍යාව
II තාක්ෂණය
III අන්තරාදායක ද්‍රව්‍ය
IV විධානය හා නායකත්වය
V ස්ථාන පාලනය හා කළමනාකරණය

02. සම්මුඛ පරීක්ෂණ

පළාත් පාලන කොමසාරිස් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින් පැවැත්විය යුතු අතර පරීක්ෂණ මණ්ඩලය හා ලකුණු ලබා දීමේ නිර්ණායකයන් පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය

05. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007 විධි විධාන අනුව 2007.07.01 දින සිට පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් සේවයට බැඳී වසර 5 ක් තුළ ලබා ගත යුතු ය. මේ සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

පත්වීමේ දින සිට වසර පහක් තුළ නියමිත දෙමළ භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක. සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

ලබාගත යුතු ප්‍රවීණතා මට්ටම III

06. <u>කාර්යක්ෂමතා කඩඉම් ලිඛිත පරීක්ෂණය</u> :-

පැය තුනක ප්‍රශ්ණ පත්‍රයකට පෙනී සිටිය යුතුය. සමත්වීම සඳහා අවම වශයෙන් 40 % ලකුණු ලබාගත යුතුය

විෂය නිර්දේශය උපලේඛණ 05 හි දැක්වේ.

(මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් පැවැත්වේ.)

<u>ප්‍රායෝගික පරීක්ෂණය</u> :-

(අ) ගිනි සරඹ පැවැත්වීම හා උපදෙස් දීම
(ආ) ගිනි නිවීම් සේවයේ උපකරණ පිළිබඳව විස්තරාත්මකව පැහැදිලි කිරීම පිළිබඳ හැකියාව පරීක්ෂා කිරීම

පළාත් පාලන කොමසාරිස් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින් පැවැත්විය යුතු අතර පරීක්ෂණ මණ්ඩලය හා ලකුණු ලබා දීමේ නිර්ණායකයන් පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2011/01/31 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

## තනතුර - ස්ථානභාර නිලධාරි/ ගිනි නිවාරණ නිලධාරි තනතුර

01. වැටුප් පරිමාණය :-

මාසික රු.15,850/=-180×7-240×2-320×8-375×17- 26,525/=
ආර්.එස්.-2-2006-( රා.ප.ච. 6/2006 A)
වැටුප් පියවර - 11 වන පියවර

මෙම වැටුප් පරිමාණයේ හතරවන වැටුප් තලයට එළඹීමට පෙර කාර්යක්‍ෂමතා කඩඉමකි.

02. වයස් සීමාව :- වයස අවුරුදු 28 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය.
(දැනටමත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

03. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :-

01. ස්ථානභාර නිලධාරි යනු ප්‍රධාන තනතුරු නාමය වේ. මෙම තනතුරට පත් කිරීමේ දී

I මෙහෙයුම්
II ගිනි නිවාරණ
III පුහුණු

යන ඕනෑම රාජකාරියක නිරතවීමට හැකියාව තිබිය යුතුය

(ස්ථානභාර නිලධාරි තනතුර දරන්නන් ඉහත ඕනෑම කාර්යයක යෙදීමට හා ඒ කාර්යන් අතර, මාරු කිරීමට අවස්ථාව ඇති වන පරිදි විධිවිධාන පිළියෙල කල යුතුය.)

I අ.පො.ස.(සා.පෙ.) විභාගයෙන් සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි ඇතුළු විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතු අතර, ඉන් විෂයයන් පහක් එක් වරකදී සමත් වී තිබීම.

හෝ

අ.පො.ස.(සා.පෙ.) විභාගයෙන් සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂා ගණිතය, රසායන විද්‍යාව හා තවත් එක් විද්‍යා විෂයයන් ඇතුළුව විෂයයන් හයකින් අඩු වශයෙන් වාර දෙකකදීවත්, සමත් වී තිබිය යුතු අතර, ඉන් විෂයන් පහක් එක් වර එක් වතාවකදී සමත් වී තිබිය යුතුය.

හා

II ලන්ඩනයේ ගිනි ඉංජිනේරු ආයතනයේ ප්‍රාථමික පරීක්‍ෂණ සහතිකය ලබා තිබිය යුතුය.

හා

III වෘත්තිය ගිනි නිවන හමුදාවක/සේවාවක හා අංශභාරව ගිනි නිවීමේ කටයුතු පිළිබඳ අවු. 05 ට නොඅඩු පළපුරුද්දක් හා සතුටුදායක සේවයක් තිබිය යුතුය.

හා

IV බාහිර අයදුම්කරුවන් මධ්‍යම පළාත තුළ වසර 03 ක ස්ථිර පදිංචියක් තිබිය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2011/01/31 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

බර වාහන පැදවීමේ වලංගු රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය.

02. කායික හා මානසික යෝග්‍යතාවය

සේවය කිරීම සඳහා සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයක් පවතින බවට රජයේ පිළිගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කල යුතුය .

04. බඳවා ගැනීමේ ක්‍රමය :-

01. පලමුව මධ්‍යම පලාත් සහා රාජ්‍ය සේවයේ ගිනි නිවීම් සේවාවේ ඉහත 03 යටතේ අදාල තනතුරට නියමිත සුදුසුකම් සපුරාලන අයගෙන් අයදුම්පත් කැඳවා පලාත් පාලන කොමසාරිස් විසින් සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත උසස් කිරීමෙන් පවත්නා පුරප්පාඩු පුරවනු ලැබේ.

එසේ සුදුසුකම් ලබන අයදුම්කරුවන් මධ්‍යම පලාත් සහා රාජ්‍ය සේවයේ ගිනි නිවීම් සේවාවේ නොමැති අවස්ථාවලදි බාහිර අයදුම්කරුවන්ගෙන් ප්‍රසිද්ධ දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 ට අනුකූලව ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගන්නා අය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව බඳවා ගනු ලැබේ.

<u>බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය</u> :-

පහත විෂයයන්ගෙන් යුක්ත පැය 03 ක ප්‍රශ්න පත්‍රයකට පෙනී සිට ලකුණු 40% ලබා සමත් විය යුතුයි.

I ගිනි නිවීම් පාලනය හා මෙහෙයුම් කටයුතු
II ගිනි නිවීමේ වාහන නඩත්තු කිරීම
III ගිනි නිවීමේ පොම්ප හා උපකරණවල තාක්ෂණික දැනුම හා ගණිත ක්‍රම
IV ගිනි බිම් ක්‍රියා මාර්ග හා අදාල ආරක්ෂණ ක්‍රම
V විධානය හා සන්නිවේදනය
- අ. ගොඩනැගිලි හා ගිනි වැලැක්වීමේ ක්‍රම
- ආ. ගොඩනැගිලිවල සවි කරන ලද උපකරණ
- ඇ ගොඩනැගිලිවල ගිනි පැතිර යාමේ ක්‍රම
- ඈ. ගිනි පුහුණු කිරීමේ ක්‍රම හා තාක්ෂණය

02. සම්මුඛ පරීක්ෂණ

පලාත් පාලන කොමසාරිස් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින් පැවැත්විය යුතු අතර පරීක්ෂණ මණ්ඩලය හා ලකුණු ලබා දීමේ නිර්ණායකයන් පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය

05. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007 විධි විධාන අනුව 2007.07.01 දින සිට පලාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක්

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2011/01/31 දින අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

සේවයට බැදී වසර 5 ක් තුළ ලබා ගත යුතු ය. මේ සදහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

පත්වීමේ දින සිට වසර පහක් තුළ නියමිත දෙමළ භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක. සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

ලබාගත යුතු ප්‍රවීණතා මට්ටම III

06. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය :-

පැය තුනක ප්‍රශ්ණ පත්‍රයකට පෙනී සිටිය යුතුය. සමත්වීම සදහා අවම වශයෙන් 40 % ලකුණු ලබාගත යුතුය

විෂය නිර්දේශය උපලේඛණ 06 හි දැක්වේ.

(මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් පැවැත්වේ.)

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2011/01/31 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

# තනතුර - ප්‍රධාන නිලධාරි ( ගිනි නිවීම් සේවා) තනතුර

01. වැටුප් පරිමාණය :-

මාසිකරු.15,850/=-180×7-240×2-320×8-375×17-26,525/=
ආර්.එස්.-2-2006-( රා.ප.ච. 6/2006 A)
වැටුප් පියවර - 22 වන පියවර
මෙම වැටුප් පරිමාණයේ හතරවන වැටුප් තලයට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

02. වයස් සීමාව :- අවුරුදු 25 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය.
(දැනටමත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර නිලධාරීන් සඳහා ඉහත උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

03. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :-

01. (අ) මධ්‍යම පළාත් සහා රාජ්‍ය සේවයේ ගිනි නිවීම් සේවාවේ ප්‍රාදේශීය ගිනි නිවීම් කටයුතු පිළිබඳව පළපුරුද්දක් ඇති ස්ථානගාර නිලධාරියෙකු ලෙස වසර 5 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ ලන්ඩනයේ ගිනි ඉංජිනේරු ආයතනයේ සාමාජිකත්වය ලබා තිබිය යුතුය.

හෝ

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක බී.එස්.සී. (රසායන විද්‍යා) උපාධිය සමත් වී තිබිය යුතු අතර. ගිනි නිවීම් සේවා කටයුතු පිළිබඳ රජය විසින් පිළිගත් ආයතනයක වසර 10 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

02. කායික හා මානසික යෝග්‍යතාවය

සේවය කිරීම සඳහා සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයක් පවතින බවට රජයේ පිළිගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුය .

04. බඳවා ගැනීමේ ක්‍රමය :-

01. (අ) පළමුව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ගිනි නිවීම් සේවාවේ ඉහත 03 (අ) යටතේ දැක්වෙන සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් අතුරින් අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයක් මගින් ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත උසස් කිරීමෙන් පවත්නා පුරප්පාඩු පුරවනු ලැබේ.

(ආ) එසේ සුදුසුකම් සපුරාලන අයවලුන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නොමැති අවස්ථාවන්හිදී ඉහත 03(ආ) යටතේ සුදුසුකම් ඇති අයගෙන් ප්‍රසිද්ධ දැන්වීම් මගින් අයදුම්පත් කැඳවා රා.ප.ච. 15/90 ට අනුකූලව පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පවත්නා පුරප්පාඩු සඳහා සුදුස්සන් බඳවා ගනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2011/01/31 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

බඳවා ගැනීමේ / උසස් කිරීමේ ලිඛිත පරීක්ෂණය :-

පහත විෂයයන්ගෙන් යුක්ත පැය 03 ක ප්‍රශ්න පත්‍රයකට පෙනී සිට ලකුණු 40% ලබා සමත් විය යුතුයි.

I විධානය , නායකත්වය සහ කළමනාකරණය
II ගිනි ප්‍රවේශම්භාවය
III ගිනි නිවීමේ සහ වැළැක්වීමේ ආඥා පනත්
IV ගිනි බිම් මෙහෙයුම් ක්‍රියා පටිපාටි

02. සම්මුඛ පරීක්ෂණ

පළාත් පාලන කොමසාරිස් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින් පැවැත්විය යුතු අතර පරීක්ෂණ මණ්ඩලය හා ලකුණු ලබා දීමේ නිර්ණායකයන් පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය

05. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007 විධි විධාන අනුව 2007.07.01 දින සිට පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් සේවයට බැඳී වසර 5 ක් තුළ ලබා ගත යුතු ය. මේ සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

පත්වීමේ දින සිට වසර පහක් තුළ නියමිත දෙමළ භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක. සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

ලබාගත යුතු ප්‍රවීණතා මට්ටම III

06. කාර්යක්ෂමතා කඩඉම :-

පැය තුනක ප්‍රශ්ණ පත්‍රයකට පෙනී සිටිය යුතුය. සමත්වීම සඳහා අවම වශයෙන් 40 % ලකුණු ලබාගත යුතුය

විෂය නිර්දේශය උපලේඛණ 07 හි දැක්වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2011/01/31 දින
අනුමත කරන ලදි

## උපලේඛනය 01

## ගිනිභට තනතුරේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ (ලිඛිත) විෂය නිර්දේශය

1. විද්‍යාව
   - (අ) දහනය
     1. දහනය සඳහා අවශ්‍ය සාධක
     2. දහනයේ විවිධ තලයන්
     3. ස්වයංදහනය
   - (ආ) උෂ්ණත්වය හා තාපය
     1. හැඳින්විම
     2. විවිධ තාප ඒකකයන්
   - (ඇ) සරල රසායනික සූත්‍ර

2. තාක්ෂණය
   1. ගිනි නිවිමේ මූලධර්ම
   2. විවිධ වර්ග වල ගිනි හඳුනාගැනිම
   3. අනතුරට පත්වූවන් ඔසවාගෙන යාම
   4. ජල සවිකිරීම්වල කාර්යය හා පාවිච්චිකරණ අවස්ථා
   5. කෘත්‍රිම ශ්වසන උපකරණවල ඇති විවිධ කොටස්වල කාර්යය
   6. බෙදා හැරීමේ ජලනල තැන්පත් කරන විවිධ ක්‍රම

3. අන්තරාකාරී ද්‍රව්‍ය
   1. මූලික හැඳින්විම
   2. ලාංඡන මගින් විවිධ අන්තරාකාරී ද්‍රව්‍ය හඳුනාගැනිම

4. ජල විද්‍යාව
   1. ජල මතුපිට ගුරුත්වාකර්ෂණයේ බලපෑම
   2. චතුරස්‍රාකාර හා වෘත්තාකාර ටැංකිවල පරිමාව ගණනය කිරීම

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2011/01/31 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම

උපලේඛනය 02

## <u>මෝටර් යාන්ත්‍රික ගිනිගට තනතුර සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂය නිර්දේශය</u>

1. මූලික ගිනි නිවීමේ ක්‍රම

i ගින්නක් ඇතිවීමට අවශ්‍ය සාධක
  තාපය ,වාතය,ඉන්ධන

ii. ගින්නක් ඇතිවීමට හේතු 1. නොදැනුවත්කම
  2. නොසැලකිලිමත්කම
  3. හදිසි අනතුරු

iii. ගිනි නිවන මාධ්‍යයන්

iv ප්‍රථමාධාර ගිනි නිවන උපකරණ

v ගිනි නිවීමේ මූලධර්ම
  1. සිසිල් කිරීම හෙවත් තාපය ඉවත් කිරීම
  2. වාතය ඉවත් කිරීම (ඔක්සිජන්)
  3. දැවෙන සුළු ද්‍රව්‍ය ඉවත් කිරීම

2. මෙහෙයුම් ක්‍රම

(අ) ගිනි වර්ග - ප්‍රධාන වශයෙන් කොටස් 4කි

1. A වර්ගයේ ගිනි - කාබනික ද්‍රව්‍ය තුලින් හට ගන්නා ගිනි යැයි කියනු ලැබේ (උදා: ලී/කඩදාසි/පිදුරු)
2. B වර්ගයේ ගිනි - ද්‍රව වර්ග තුලින් හට ගන්නා ගිනි (උදා: පෙට්‍රල්/ඩීසල්/භූමිතෙල්)
3. C වර්ගයේ ගිනි - වායු වර්ග තුලින් හට ගන්නා ගිනි ( උදා : ඊතේන්/මීතෙන්/බියුටේන්)
4. D වර්ගයේ ගිනි - ලෝහ වර්ග තුලින් හට ගන්නා ගිනි ( උදා: යකඩ/ඇලුමිනියම්/වානේ)

ඉහත ගිනි නිවීමට යොදා ගන්නා මාධ්‍ය

A වර්ගය සඳහා - ජලය
B වර්ගය සඳහා - පෙණ ද්‍රාවනය
C වර්ගය සඳහා - වියලි කුඩු /$CO_2$
D වර්ගය සඳහා - වියලි කුඩු / පෙණ ද්‍රාවනය /$CO_2$

විදුලි ගිනි සම්බන්ධයෙන් භාවිතා කරනු ලබන්නේ $CO_2$ මෙම විෂය විදුලි ගිනි වශයෙන් වෙනම සාකච්ඡා කෙරේ.

(ආ) පොම්ප

1. පොම්පයක් යනු කුමක් ද?
2. පොම්පයක තිබිය යුතු ලක්ෂණ
3. වර්ග (අ) සෙන්ට්‍රිෆියුගල්
   (ආ) පොසිටිව් ඩිසිප්ලේසමන්
4. වතුර උරා ගැනීමේ ක්‍රම (ප්‍රයිම් වර්ග)
5. පොම්පයක පීඩනය අඩු වැඩි වීමට හේතු
6. වාතය ඉවත් කිරීමට අපොහොසත් වන හේතු

(ඇ) ජලනල වර්ග 7. වැකුම් අඩුවෙන් හෝ වැඩියෙන් සටහන් වීමට හේතු (ගේජ් එකෝ)
8. පොම්ප පරීක්ෂා කිරීම

3. අතුරු ව්‍යවස්ථා සහ ගිනි ආරක්ෂණ. රෙගුලාසි සම්බන්ධයෙන් අවබෝධය ලබා තිබිය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2011/01/31 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

## උපලේඛනය 03

### පළමුපෙළ ගිනිගට තනතුර සඳහා අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාග විෂය නිර්දේශය

1. විද්‍යාව
   - (අ)
     1. ගින්නේ රසායනය
     2. මූලික රසායනය
     3. පරමාණු හා අණු
     4. කෙටි යෙදුම්
     5. දහනය
   - (ආ)
     1. ගිනි ත්‍රිකෝණය
     2. තාපය සංක්‍රමණය
     3. ගිනි වර්ග
     4. ගිනි නිවීමේ ක්‍රම
   - (ඇ) ගණනය කිරීම්

     ඍජුකෝණාස්‍රයක/සමචතුරස්‍රයක/චතුරස්‍රයක/වෘත්තයක වර්ගඵලය(පරිමාව. ධාරිතාව සෙවීම ටැංකියක ජල නලය)

2. තාක්ෂණය
   - (අ)
     1. ගින්නේ ස්වභාවය
     2. ගිනි ගන්නා
     3. ගින්න නිවීමට සඳහා භාවිතා කරන මාධ්‍ය
     4. ගින්නට ප්‍රවේශ වීමේදී ගතයුතු ක්‍රියාමාර්ග
   - (ආ) ගිනි ආරක්ෂක විධිවිධාන සම්බන්ධව
     1. සවිකර ඇති ගිනි නිවන උපකරණ
     2. ගිනි ප්‍රවේශ
     3. නැගුම් මූලික නල
     4. තෙත් නැගුම් මූලික නල
     5. හෝස්රීල්
     6. සංඥා උපකරණ
     6. ජලය විදින උපකරණ (ස්ප්‍රින්කර්)
     7. ඩිටෙක්ටර්ස්

     වශයෙන් ගොඩනැගිල්ලක ගිනි ආරක්ෂක උපකරණ පිළිබඳ අවබෝධය තිබිය යුතුය
   - (ඇ) ප්‍රථමාධාර ගිනි නිවන උපකරණ

3. අන්තරාදායක ද්‍රව්‍ය

4. අතුරු ව්‍යවස්ථා සහ ගිනි ආරක්ෂක විධිවිධාන සම්බන්ධව දැනුම.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2011/01/31 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම

උපලේඛනය 04

**<u>මූලික ගිනිගට තනතුර සඳහා අදාළ කාර්යක්ෂමතා කඩඉම් විෂය නිර්දේශය</u>**

1.විද්‍යාව

(අ) ගින්නේ රසායනය
මූලික රසායනය
පරමාණු හා අණු
කෙටි යෙදුම්
දහනය
ගිනි ත්‍රිකෝණය
සංක්‍රමනය
ගිනි වර්ග
ගිනි නිවීමේ ක්‍රම

(ආ) ගණනය කිරීම්
සෘජුකෝණාස්‍රයක/සමචතුරස්‍රයක/චතුරස්‍රයක/වෘත්තයක
වර්ගඵලය(පරිමාව. ධාරිතාව සෙවීම ටැංකියක ජල නලයක)

2. තාක්ෂණය

(අ) ගින්නට ප්‍රවේශවීම
මූලික ක්‍රියාමාර්ග
ගින්නේ ස්වභාවය
ගිනි නිවන ද්‍රව්‍ය
ගිනි ගන්නා මාධ්‍ය

(ආ) ගොඩනැගිල්ලක සවිකොට ඇති ගිනි ආරක්ෂණ ක්‍රම
සවිකර ඇති ගිනි නිවන උපකරන
ගිනි ප්‍රවේශ
නැගුම් මූලික නල
තෙත් නැගුම් මූලික නල
හෝස්රීල්
සංඥා උපකරණ
ජලය විදින උපකරණ
ඩිටෙක්ටර්

(ඇ) පෙන ද්‍රාවන වර්ග
(ඈ) ඉනිමං වර්ග

යනාදි වශයෙන් සියළුම උපකරණ වල ක්‍රියාකාරීත්වය සහ තාක්ෂණය සම්බන්ධව නිසි අවබෝධය

3. අන්තරාදායක ද්‍රව්‍ය

4. විධානය හා නායකත්වය

1. කණ්ඩායම පාලනය කිරීම
2. විනය පවත්වා ගෙනයාම
3. අණදීම හා මෙහෙයවීම
4. උපදෙස් ලබා දීම
5. ගින්නකදී හෝ ජිවිත බේරා ගැනීමකදී තම කණ්ඩායම් අනතුරකට පත් නොවන පරිදි මෙහෙයවීම
6. පාලන මැදිරිය සහ ගිනි බිම අතර සම්බන්ධතාවය

5. අතුරු ව්‍යවස්ථා සහ ගිනි ආරක්ෂක විධි විධාන. රෙගුලාසි වලට අදාල දැනුම

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2011/01/31 දින
අනුමත කරන ලදි.
ආණ්ඩුකාර ලේකම

උපලේඛණය 05

අංශ භාර නිලධාරි තනතුර සඳහා අදාල කාර්යක්ෂමතා කඩඉම් විෂය නිර්දේශය

1. විද්‍යාව

(අ) ගිනි ඉංජිනේරු විද්‍යාව සම්බන්ධව අදාල මූලික විද්‍යාව සහ ප්‍රධාන කරුණු
(ආ) මූලික ගණනය කිරීම්
(ඇ) ඝනත්වය. පරිමාව. ස්කන්ධය
(ඈ) පරමාණු හා අණු
(ඉ) මූල ද්‍රව්‍ය කෙටි යෙදුම්
(ඊ) තාපය
(උ) දහනය
(ඌ) ගිනි වර්ගීකරණය

2. තාක්ෂණය

1. ගින්නට ලගාවීම
2. ගින්න පරීක්ෂා කිරීම.
3. ගින්න සමග සටන් කිරීම
4. ජීවිත ගලවා ගැනීම
5. ස්ථානය අනුව ගිනි නිවීම
6. වාතාශ්‍රය සැපයීම.
7. ගිනි නිවන උපකරණ භාවිතය
8. ප්‍රථමාධාර ගිනි නිවන උපකරණ
9. කෘත්‍රිම ශ්වසන උපකරණ
10. ගිනි නිවීම් සේවාවේ භාවිතා කරන ගැට වර්ග සහ ලනු වර්ග

3. ගිනි ආරක්ෂක කටයුතු/අන්තරාදායක ද්‍රව්‍ය

1. ගොඩනැගිලි ඉදිකිරීමේ අමු ද්‍රව්‍ය
2. ගොඩනැගිලි සැදීම.
3 ගොඩනැගිලිවල සවි කරන ආරක්ෂක උපකරණ වර්ග
4. ගිනි නිවාරණ කටයුතු හා පුහුණු කිරීම.

4. විධානය හා නායකත්වය

1. සියළුම කණ්ඩායම් පාලනය.
2. වෙනත් අංශ සමග සම්බන්ධතාවයන්
3. විනය පවත්වාගෙන යාම.
4. අණදීම හා මෙහෙයවීම
5. උපදෙස්
6. පුහුණු කිරීම
7. කණ්ඩායම් අවශ්‍යතාවයන්. විශේෂ අවශ්‍යතාවයන් හා පුද්ගලික අවශ්‍යතාවයන්

5. ස්ථාන පාලනය හා කළමණාකරනය

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2011/01/31 දින අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

1. සම්පත් කළමණාකරනය
2. වාර්තා නිසි පරිදි පවත්වාගෙන යාම
3. ගබඩා නිසිපරිදි පවත්වාගෙන යාම
4. වාහන නඩත්තුව
5. පුහුණු කටයුතු
6. අවශ්‍ය උපකරණ අවශ්‍ය වේලාවට ලබාගැනීම හා ලබාදීම

6. අතුරු ව්‍යවස්ථා සහ ගිනි ආරක්ෂක විධිවිධාන සම්බන්ධව දැනුම

උපලේඛණය 06

## ස්ථාන භාර නිලධාරි/ ගිනි නිවාරණ නිලධාරි තනතුර සඳහා අදාල කාර්යක්ෂමතා කඩඉම් විෂය නිර්දේශය

### 1. ගිනි නිවීම් පාලනය හා මෙහෙයුම් කටයුතු

ගිනි නිවීම

ගින්න මැඩ පැවැත්වීම | පරීක්ෂාකාරි බව

01. ගින්න මැඩ පැවැත්වීම

| ගින්නට පෙර | ගින්නේදී | ගින්නට පසු |
|---|---|---|
| 1. ගිනි නිවාරණ අංශය | 1. ගින්න හඳුනා ගැනීම | 1 භාවිතා කල ගිනි නිවන උපකරන යථා තත්වයට පත් කිරීම |
| 2. ගිනි ආරක්ෂාව | 2 ගිනි නිවන උපකරන හඳුනා ගැනීම | 2 සිදු වූ අනුපාදු සම්බන්ධව කතා කිරීම |
| 3. ගිනි නිවන උපකරණ | 3. උපකරණ භාවිතා කිරීම | |
| 4. පුහුණු කිරීම. | 4. ගින්න නිවීමට අපහසු සගයෙකුගේ සහය ලබා ගැනීම | |

2. පරීක්ෂාකාරි බව

1. සාමාජිය උපක්‍රම (උපායන්)
   1. කෙලින්ම සම්බන්ධ වීම
   2. ගිනි සංඥා භාවිතය
   3. දුරකතන භාවිතය
2. උපකරණ

ගොඩනැගිලි වල ගිනි ආරක්ෂාව සඳහා සවිකල සියළුම උපකරණ මීට අදාල වේ.

ඉහත සටහනට අනුව ගිනි නිවීම පාලනය හා මෙහෙයුම් සම්බන්ධව සියළු කරුණු අඩංගුය. මෙහි අඩංගු සියළුම කරුණු සම්බන්ධව දැනුම අපේක්ෂා කෙරේ.

### 2. ගිනි නිවීමේ වාහන නඩත්තු කිරීම

ගිනි නිවීම සේවාවක ඇති සියළුම රථ මෙයින් අදහස් වේ. එනම්, ගිනිරථ, ජිවිත ගලවා ගැනීමේ රථ ආදී සියළුම උපකරණ වල සේවා තත්ත්වයන් නිසි පරිදි පවත්වා ගෙන යාම නඩත්තු කිරීම, සේවාවත් කිරීම මින් අදහස් කෙරේ. ස්ථාන භාර නිලධාරියෙකු සතුව අනිවාර්ය දැනුමක් මේ සම්බන්ධයෙන් තිබිය යුතු ය. ඔතැම අවස්ථාවක ඕනෑම රථයක් අවශ්‍යතාවයක් අනුව යොදා ගැනීමේ හැකියාව තිබිය යුතුය. එසේ ම වාහන නඩත්තුව සඳහා දැනුම අනිවාර්ය වේ.

### 3. ගිනි නිවීමේ පොම්ප හා උපකරණ වල තාක්ෂණික දැනුම

1. පොම්ප වර්ග
2. ප්‍රයිමිං වර්ග (වතුර උරා ගැනීමේ ක්‍රම)
3. පොම්පයක් වතුර උරා ගැනීමේදී දක්වන දුර්වලතාවයන්ට හේතු
4. පොම්ප පරීක්ෂා කිරීම.
5. පොම්ප සඳහා භාවිතා කරන උරා ගැනීමේ නල
6. රික්තමාන. පීඩක රික්ත මානය

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2011/01/31 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර

4. ගිනි බිම් ක්‍රියාමාර්ග හා ආරක්ෂක ක්‍රම

ගිනි බිම් ක්‍රියාකාරිත්වයට පහත කරුනු සම්බන්ධව අවබෝධය වැදගත්ය

1. ආරක්ෂාව
   1. අණදිම.
   2. විනය
   3. අවශ්‍ය උපදෙස් අවශ්‍ය වේලාව ලබා දිම
   4. උපකරණ.
2. උදව්වට සිටින වෙනත් කණ්ඩායම්
   1. මිනිස් බලය
   2. උපකරණ
   3. පහසුකම් (උපකරණ සම්බන්ධව)
3. ජනතාව පාලනය කිරිම - පොලිසිය

4. මිට අමතරව ගිනි ප්‍රතිරෝධතාවයන් හා වතුර ටැංකිවල ධාරිතාවන් ගණනය කිරිම සම්බන්ධව දැනුම.

5. විධානය හා සන්නිවේදනය

විධානය හා සන්නිවේදනය ගිනි නිවිම් සේවාවක වැදගත්ම අංශය වේ. ඊට හේතුව ඉක්මනින් ක්‍රියාමාර්ග ගැනිමට පහසුවිමයි. ඒ යටතේ පහත කරුණු වැදගත්වේ.

1. මූලස්ථානය හා ගින්න ඇති ස්ථානය අතර සම්බන්ධය
2. ගින්නක් සංඥා උපකරණ මගින් පාලනය කිරිමට උපදෙස් දිය හැකිවිම
3. අතේ ගෙන යා හැකි සංඥා උපකරණ සහ එවැනි උපකරණ අතර
4. අතින් ක්‍රියාත්මක කළහැකි උපකරණ

ඉහත සම්බන්ධතා විධානයන් දිමේදි ඊට සම්බන්ධ කර ගන්නා සන්නිවේදන ක්‍රමය ඉතා වැදගත් වේ. ඒ හා දැනුම අනිවාර්ය වේ.

(අ) ගොඩනැගිලි හා ගිනි වැලක්විමේ ක්‍රම
1. ගොඩනැගිලි ඉදි කිරිමට ගන්නා අමු ද්‍රව්‍ය පිලිබඳ අවබෝධය
2. ගොඩනැගිලි සැලසුම්
3. පිටවිමේ දොරටු
4. ගිනි ප්‍රතිරෝධයන්
5. හැරයාමේ කාලය
6. වහල වර්ග. ජනෙල් දොරටු, බිම් වර්ග
7. පඩිපෙල්

(ආ) ගොඩනැගිලි වල සවි කරන ලද උපකරණ.
උදා: ප්‍රථමාධාර ගිනි නිවන උපකරණ/ නැගුම් මූලික නල/ තෙත් නැගුම් මූලික නල/ ජල විදින උපකරණ යනාදි සියළුම උපකරණ සම්බන්ධව

(ඇ) ගිනි පැතිර යාමේ ක්‍රම.
1. සංවහනය 2. සන්නයනය 3. විකිරනය

(ඇ) ගිනි පුහුණු කිරිමේ ක්‍රම හා තාක්ෂණය
1. යෝජනා කරන පුහුණු කටයුතු සම්බන්ධව අංශ හෝ මූලස්ථාන දැනුවත් කිරිම
2. ගිනි සරම සම්බන්ධව යෝජනා හා සැකසුම
3. ලබා දෙන පුහුණුව සම්බන්ධව සාකච්ජා කිරිම හා හදුන්වා දිම.
4. ඉගැන්විමේ විවිධ ක්‍රම
5. පුහුණු කිරිම හා පාලනය

(ඉ) අතුරු ව්‍යවස්ථා සහ ගිනි ආරක්ෂන විධිවිධාන සම්බන්ධ අවබෝධය

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2011/01/31 දින අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම

## උපලේඛණය 07

**ප්‍රධාන නිලධාරි තනතුර සඳහා අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂය නිර්දේශය**

1. විධානය නායකත්වය සහ කළමනාකරණය .

   1. ප්‍රධාන මෙහෙයුම් සහ උපක්‍රම.
   2. ගිනි නිවීම් සේවා වගකීම් (ගින්නක් සහ ගින්නක් නැති විටදි )
   3. අවශ්‍ය පහසුකම් ලබා ගැනිම නිලධාරින්ට සහතික වේ උදා: ජලය ලබා ගැනීම සහ පෙණද්‍රාවණය)
   4. සන්නිවේදන උපකරණ
   5. රාජකාරි සම්බන්ධ අවබෝධය
   6. සංවිධානයක පහත සඳහන් කරුණු සම්බන්ධව සාකච්ජා කල යුතුය සැලසුම් කිරිම/ සංවිධානය/ අණදිම/ සම්බන්ධිකරණය/ පාලනය කිරිම/ ඇසීම හා ඇහුම් කන්දිම
   7. වගකිම සම්බන්ධතාවයන් කාර්ය මණ්ඩල රාජකාරි සහ කරන කාර්ය සම්බන්ධව කළමනාකරණය. අංශ කළමනාකරණය
   8. අවශ්‍ය සටහන් පවත්වා ගෙන යාම/ කාර්ය මණ්ඩල වලට දැනුම්දිමේ ක්‍රම/ අනතුරු සම්බන්ධව
   9. අය වැය වාර්තා
   10. ගබඩා සහ ලේඛන හා භාණ්ඩ
   11. වාහන නඩත්තුව සහ හදිසි අනතුරු

2. ගිනි ප්‍රවේසම්භාවය

   1. ගොඩනැගිලි කඩා වැටිමේ අවදානම සහිත සලකුණ
   2. ගිනි නිවාරණ හා පුහුණු නිලධාරින්ගේ උපදෙස් සම්බන්ධව

3. ගිනි නිවිමේ සහ වැළැක්විමේ ආඥා පනත්

   1. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය මගින් පනවා ඇති ගිනි නිවීම් සේවාවට අදාල අණ පනත් හා අතුරු ව්‍යවස්ථා සම්බන්ධවත්
   2. බ්‍රිතාන්‍ය ගිනි ඉංජිනේරු ආයතනය විසින් හදුන්වාදි ඇති සියළු නියමයන් හා නීති රෙගුලාසි සම්බන්ධව

4. ගිනි බිම් මෙහෙයුම් ක්‍රියා පරිපාටි

   1. ලගා වූ වහාම ගන්නා ප්‍රථම ක්‍රියාමාර්ග
   2. අවශ්‍ය ස්ථානයට යොමු කිරිම.
   3. කෘත්‍රිම ස්වසන උපකරණ භාවිතා කිරිම
   4. ජලයෙන් සිදුවන හානි වැළැක්විම සහ වාතාශ්‍රය ලැබිමට සලස්වන විධි විධාන.
   5. ගින්නට ලගාවීමේ ක්‍රම සහ ගිනිහට සටන් කිරිම.
   6. ජිවිත ගලවා ගැනීමේ තාක්ෂණය.
   7. ජල සැපයුම් මාර්ග භාවිතා කිරිම.

5. ආයතන සංග්‍රහයේ සහ මූදල් රෙගුලාසි පිළිබද දැනුම .

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2011/01/31 ........................දින
අනුමත කරන ලදි
ආණ්ඩුකාර ලේකම

2011. 01. 04 දිනැති කොමිෂන් සභා රැස්වීම් දිනයේදී කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

| | | |
|---|---|---|
| 1. එස්. බී. බැද්දේවෙල මහතා | (සභාපති) | |
| 2. ටී. වී. මාරිමුත්තු මහතා | (සාමාජික) | |
| 3. ජේ. එම්. ගපූර් මහතා | (සාමාජික) | |
| 4. යූ. ජේ. බෝගහපිටිය මහතා | (සාමාජික) | |
| 5. පී. පී. එස්. ජේ. දිසානායක මිය | (සාමාජික) | |

අනුමත කරමි / ~~නොකරමි~~.

විකිරී කොබ්බෑකඩුව
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
2011. 01. 31